# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 557/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 31/03/2024 පැය 1025

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.03.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 116 | - | යතුරුපැදි 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ එම අවියට යොදන ජීව උණ්ඩ 5ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුර.**

2024.03.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොළ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගලහ පොලිස් වසමේ පුපුරැස්ස නුවරඑළිය මාර්ගයේ අයුර්වේද කැල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ එම අවියට යොදන ජීව උණ්ඩ 05ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගලහ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 32ක් වූ දෙල්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගලහ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර කොන්දේසි උල්ලංගනය කරමින් වැලි කැණීම් කළ පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට -පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර**

2024.03.30 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මූතූර් පොලිස් වසමේ භාරතීපුරම් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් වැලි කැණීම් කළ පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන මූතූර් පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 28 යන වයස් වල පසුවන කිලිවෙඩ්ඩි සහ මූතූර් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මූතූර් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. ගංජා හේනක් වැටලීම සම්බන්ධව - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.03.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හම්බේගමුව පොලිස් වසමේ උඩවලව ජාතික වනෝද්‍යානයේ රතඹලාගම ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **වගා කර තිබු ගංජා පැල 109,146 ප්‍රමාණයක් සොයා ගෙන ඇති අතර පැල 30ක් විමර්ශන කටයුතු සඳහා සාම්පල් වශයෙන් ගෙන හම්බේගමුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. අනෙකුත් පැල ස්ථානයේදීම ගිනි තබා විනාශ කිරීමට කටයුතු කර ඇත .**

හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**